# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/32 – 2018 ජූලි 04 වැනි බදාදා – 2018.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

*මගේ අංකය*: IR/COM/02/2017/107.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්*

1. එන්. ජී. විල්සන් මයා, අංක 166, කෝරල මායිම් පාර, බටහිර කලටුවාව, තුම්මෝදර.

2. එච්. පී. එස්. හේවාවසම් මයා, අංක 47, රත්නපුර පාර, කලුඅග්ගල, හංවැල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

පිළියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89 F, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුනි මස 25 වැනි දින,
කොළඹ දී ය.



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*මගේ අංකය*: IR/COM/02/2017/107.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

1. එන්. ජී. විල්සන් මයා, අංක 166, කෝරල මායිම් පාර, බටහිර කලටුවාව, තුම්මෝදර.

2. එච්. පී. එස්. හේවාවසම් මයා, අංක 47, රත්නපුර පාර, කලුඅග්ගල, හංවැල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,

''එන්. ජී. විල්සන් මයා හා එච්. පී. එස් හේවාවසම් මයා යන සේවකයින් දෙදෙනා ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයට මුලින්ම බැඳී ඇත. එවකට ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුමත අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දී, 1991 දී ඇති වූ ජනතාකරණ ක්‍රියාවලියෙන් පසුව ජනතා සන්තක බස් සමාගම්වල සේවකයන් බවට පත් කර ලංගම අනුමත අර්ථසාධක අරමුදලෙන් ඉවත් කර සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය ලබා දී නැවත 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව හා 2011 අංක 11 දරන ශ්‍රී ලංගම චක්‍ර ලිපිය අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් බවට පත් වූ පසු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල අනුමත අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය ලබා නොදීම නිසා, යම් අසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 581

---

*මගේ අංකය*: IR/COM/02/2017/222.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඊ. ජෙගදීසන් මයා, ප්‍රධාන ඉංජිනේරු, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, සිවන්පන්නයි පාර, යාපනය

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, ගාලු පාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන

පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/02/2017/222.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඊ. ජෙගදීසන් මයා, ප්‍රධාන ඉංජිනේරු, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය. *සිවන්පන්නයි පාර, යාපනය*

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, ගාලු පාර, රත්මලාන.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,

''ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරුවරයකු ලෙස සේවය කරන ඊ. ජෙගදීසන් මහතාට අදාළ ප්‍රධාන ඉංජිනේරු තනතුර 2013.04.01 දිනට පෙර ලබා නොදීම තුලින් යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න, හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 582

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.